සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

**නාට්‍ය හා රංගකලාව - I** | 57 S I | කාලය: පැය දෙකයි

විභාග අංකය: ..................................................

* I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
* II කොටසෙහි පිළිතුරු I පත්‍රයට අමුණන්න.
* 2 පත්‍රයේ A හා B කොටස් වලින් ඉංග්‍රීසි අක්ෂරය දමන්න.
* ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

* **නිවැරදි ප්‍රකාශය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

1. භරතමුණි නාට කලාවේ විශේෂත්වය හඳුන්වා දෙන ශ්ලෝකහි නාට්‍ය යන නම දැරීමට සුදුසු ලක්ෂණ සඳහන් කොට ඇත. එම ලකෂණ අන්තර්ගත ගොනුව තෝරන්න.
   1. ප්‍රයෝගයක්, ක්‍රියාවක්, ශිල්පයන් හා ඥානයක් තිබිය යුතුය.
   2. ඥාණයක් , ශිල්පයක් , විද්‍යාවක්, කලාවක් , ප්‍රයෝගයක් හා ක්‍රියාවක් පැවැතිය යුතුය.
   3. ස්මෘතියක් , අනුකරණයක්, ශිල්පයක්, හා කෞෂල්‍යයක් තිබිය යුතුය.
   4. අනුකරණයක්, ප්‍රයෝගයක්, දුරදක්නා නුවණක් තිබිය යුතුය.
   5. පළපුරුද්දක් , ශිල්පීය හැකියාව , ඥානය හා ප්‍රයෝගයක් තිබිය යුතුය.

2. දශ රූපකය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?
   1. සංස්කෘත නාට්‍යයේ නාට්‍යධර්මී රූපණය සම්බන්ධ අභ්‍යායාස දහයකි.
   2. ලිඛිත පිටපතක් සහිත සංස්කෘත නාට්‍යය ප්‍රභේද දහයකි.
   3. අංක සංඛ්‍යා දහයකින් යුක්ත වූ නාට්‍ය වර්ග දහයකි.
   4. භරතමුනි රචනා කර ඇති ග්‍රන්ථයකි.
   5. මහා කවි කාලිදාස ප්‍රබන්ධ කළ ග්‍රන්ථයකි.

3. ආහාර්ය අභිනයට අයත් අංග පමණක් අන්තර්ගත වරනය තෝරන්න.
   1. රූපණය , නාට්‍ය පෙළ, පුස්ත, රංගාලෝකය
   2. සංගීතය, රංග විධාන, අංග රචනය, සජ්ජීම
   3. රංගාලෝකය, ආභරණ , රූපණය , අංග රචනා
   4. අංගරචනා, අලංකාර, සංවාද පුස්ත
   5. පුස්ක, අලංකාර, අංගරචනා , සජ්ජීම

4. මාරියස් ලෙටිපා හා ලෙඩ් ඉවනොව් විසින් නර්තන රචනය කරන ලද '' නට් කැකර්'' කෘතිය අයත් වන්නේ කුමන ප්‍රාසාංගික කලාවටද ?

   1. ග්‍රීක නාට්‍ය 2. ඔපෙරා 3. නාට්‍ය 4. මුද්‍රා නාට්‍ය 5. බැලේ

5. ගැටුමක් නැති තැන නාට්‍යයක් නැතැයි යන ප්‍රකාශය කරන ලද්දේ ?

1. ස්ටැනිස්ලව්ස්කි විසිනි  2. ෂොන් පෝල් සාත්‍ර විසිනි

3. ජෝර්ජ් බර්නාඩ් ෂෝ විසිනි  4. ඇරිස්ටෝටල් විසිනි  5. භාරතමුනි විසිනි

6. ප්‍රාසාංගික කලා යන්නෙන්,

1. සියලුම ලලිත කලා අදහස් කෙරේ.

2. රංගනයෙන් ගායනයෙන් හා කථනයෙන් කථාවක් ඉදිරිපත් කරන කලාව අදහස් කෙරේ.

3. ශ්‍රව්‍ය - දෘශ්‍ය කලා සියල්ල ගම්‍ය වේ.

4. ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරනු ලබන ශ්‍රව්‍ය - දෘශ්‍ය නිර්මාණ අදහස් කෙරේ.

5. විවිධ ප්‍රසංග මගින් ඉදිරිපත් කරන කලාංග යන අදහස ගම්‍ය වේ.

7. ''නෘත්‍ය '' යනු

1.

2. රිද්මයක් ,අර්ථයක් , මනෝභාවයක් සහිත නර්තනයකි.

3. ''නෘත්ත'' යන පදයට සමාන අරුත් දෙන්නකිත

4. නර්තනය පුහුණු වන අවස්ථාවේ පමණක් අදාළ වන්නකි.

5. නාට්‍ය කලාවෙහි කිසි විටෙක නො යෙදෙන්නකි.

8. ආහාර්ය අභිනය ලෙස හැඳින්වෙන්නේ ,

1. ආංගික අභිනයෙන් ප්‍රකට කරන අදහස්ය.  2. ආලෝකය සහ , ගීත ගායනා ය.

3. නාට්‍ය උපකරණ , සංගීතය හා භාව ප්‍රකාශනය.  4. නළුවා බැහැරින් ආරෝපණය කරන දෑය.

5. වේදිකාව මත ඇති සියලු දෑය.

9. කලාව නිර්වචනය කිරීම අමාරු වන්නේ,

1. එය පුද්ගලබද්ධ බැවිනි.

2. එහි විෂ ක්ෂේත්‍රය අසීමිත බැවිනි.

3. එය ප්‍රතිභාව මත පදනම් වන බැවිනි.

4. එහි විවිධ වර්ගීකරණය ඇති බැවිනි.

5. එය ස්වභාවධර්මය හා සම්බන්ධ බැවිනි.

10. පහත දැක්වෙන ගැමි කලාව සම්බන්ධයෙන් වූ ප්‍රකාශ කිහිපයකි.

A. ගැමි සාමාජීය ඇදහිලි විශ්වාස සහ සිරිත් විරිත් පදනම් කරගෙන බිහි වූ කලා විශේෂයකි.
B. ලාලිත්‍යයෙන් එකට කරන කලා විශේෂයකි.
C. රටක දේශීය සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කරන නිර්මාණ විශේෂයකි.
D. සංගීතය , චිත්‍ර, නර්තනන, නාට්‍ය සියලු කලා මෙ ගණයට ඇතුළත් වේ.
E. විවිධ කලා මෝසතර වලින් යුක්තය.

ඉහත සඳහන් ඒවායින් ගැමි කලාවට නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය තෝරන්න.

1. AB  2. ACE  3. ABE  4. CDE  5. BDE

*** පහත දැක්වෙන ප්‍රශ්න අංක 11 සිට 17 දක්වා ප්‍රශ්නවලට නොලගැළපෙන පිළිතුර සඳහන් කරන්න.**

11. 1. කපුයක්කාරිය  2. මුවමල විදීම  3. දරු නැළවිල්ල

4. දොළහ පෙළපාලිය  5. පිච්චමල් බිසව

12. 1. ඇත් බන්ධනය 2. කිරිමඬුව 3. මී බන්ධනය
4. ගම්මඩුව 5. මංගර

13. 1. පනික්කිලේ 2. නොංචි 3. වෙස් අත්ත
4. තානායම්පල 5. සොත්තානා

14. 1. දේශනවාදීන් 2. හඬ දූතයෝ 3. කරළිය
4. සෙල්ලන් ළමා 5. මුදලි.

15. 1. ආඬිගුරු 2. පච්චමීරා 3. ආරච්චි
4. කමත 5. කාලි අම්මා



16. 1. වඩමෝඩි 2. තෙන් මෝඩි 3. මකීඩ්
4. කෝවලන් 5. විලාසම්

17. 1. රති 2. බ්‍රහ්මා 3. අර්ජුන 4. ශිවන් 5. තිරුවිලා

**නිවැරදි පිළිතුර තෝරන්න.**

18. හින්දු දෙවගනන් උදෙසා පැවැත්වෙන උත්සවය වන්නේ ,
1. තෛයිපොංගල් ත්සවය 2. නව රාත්‍රී උත්සවය 3. මාටුපොංගල් උත්සවය
4. දීපවාලී උත්සවය 5. මහාශිව රාත්‍රී උත්සවය

* **පහතින් සපයා ඇති ඡායාරූපවල දැක්වෙන නාට්‍යකරුවන් හඳුනාගෙන 19 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඡායාරූපවලට දී ඇති ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න ඉදිරියේ දී ඇති හිස්තැන් තුළ යොදන්න.**

19. ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදනය කළ දේශීය නාටයකරුවා වන්නේ. ( )

20. තමන්ගේ නාට්‍ය නිර්මාණවලට සංගීතය යොදා නොගත් නාට්‍යකරුවා වන්නේ ( )

21. මෝදර මෝල නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා වන්නේ ( )

22. නාට්‍ය ධර්මී ශෛලිය අනුගමනය කළ නාට්‍යකරුවා වන්නේ ( )

23. යක්ෂා ගමනය , ට්‍රෝජන් කාන්තාවෝ යන(දේශපාලන ගැටලු තේමා කගරගත්) නාට්‍ය දේශීය වේදිකාවට ගෙන එන ලද නාට්‍යකරුවා වන්නේ. ( )

* **පහත සඳහන් දෙබස් ඛණ්ඩ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළ යොදන්න.**

'' දේවයන් වහන්ස ඔහුගේ භාර්යාවන්ගෙන් සාකේත නුවර හිටපු සිටුවරයෙකුගේ දුවක් ළඟ දී පුංසවන උත්සවය පැවැත්තුවැයි ''

24. අභිඥාන ශාකුන්තලයේ ඉහත සංවාදයේ එන පුංසවත යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?
1. මියගිය මුතුන් මිත්තන් වෙනුවෙන් පැවැත්වෙන උත්සවයයි.
2. පුතුන් නැති මව්වරුන් වෙනුවෙන් පැවැත්වූ උත්සවයයි.
3. පිරිමි දරුවෙකුගේ උපත සහතික කරනු වස් පවත්වා උත්සවයයි.
4. හිරු දෙවියන් වෙනුවෙන් පවත්වන උත්සවයයි.
5. ගුරුවරුන් වෙනුවෙන් පවත්වන උත්සවයයි.

25. සහන් එළියේ වන්චන්ද්‍ර මණ්ඩලේ - සිහින් සෙවනැලි වැටෙන යාමේ.

කුවේණි නාට්‍යයේ මෙම ගීතය ගායනා කරන්නේ

1. ජීවහත්ත 2. විජය 3. කුවේණි 4. දඩයක්කරු 5. දිසාලා

'' ඒත් .. මට හිතෙනවා මුළු ලෝකෙටම පිස්සු කියලත්..මුළු ලෝකෙම දකින්නේ හීනයක්ද කියලාත් මම ඉන්නවද නැද්ද මම දන්නේ නෑ ... මේ බලන්න ඇග කෙනිත්තුවත් මට වේදනාවක් දැනෙන්නේ නෑ.මම දන්නේ නෑ මම ඉන්නවද කියලවත්...''

26. ඉහත සංවාද ඛණ්ඩ ප්‍රකාශ කරන ලබන්නේ,

1. දඩයක්කරු 2. ජීවහත්ත 3. කුවේණි

4. පළමු නීතිඥයා 5. දිසාලා

27. පෙර රදුන් දූවරු - ගඳඹුන් විවා සිරිතට

සරණ වූවයි යෙන් - පියවරු ඒ අනු දත්හු

ඉහත සංවාදය ප්‍රකාශ කරනු ලබන්නේ

1. කන්ව ඉසිවරයා 2. සකුන්තලා 3. දුෂ්‍යන්ත

4. ප්‍රියංවදා 5. ගෞතමී

*** පහත දැක්වෙන වෙස්මුහුණු අධ්‍යනය කොට අංක 28 සිට 29 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඡායාරූප වලට දී ඇති ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න ඉදිරියේ ඇති හිස්තැන තුළ යොදන්න.**



මූර්ත සන්නිය




අණබෙර කෝලම

28. A අක්ෂරයෙන් දැක්වෙන්නේ

1. පේඩි කෝලමේ මුහුණයි. 2. කොර සන්නියේ මුහුණයි. 3. කණ සන්නියේ මුහුණයි
4. මුර්තු සන්නියේ මුහුණයි 5. අමුක්කු සන්නියේ මුහුණයි.

29. B අක්ෂරයෙන් දැක්වෙන්නේ

1. ජස කෝලමයි 2. අණබෙර කෝලමයි 3. සක් දෙවියන්ගේ මුහුණයි.

4. දෙමළ සන්නියේ මුහුණයි 5. කෝල සන්නියේ මුහුණයි

*** පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් අංක 30 සිට 35 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු වල අක්ෂර වරහන තුල යොදන්න.**

A ඉන්දු ධර්මසේන F ඇන්ටිගනි හමම

B ද රයිවල්ස් G බෙර හඩ

C මගුල් ප්‍රස්තාව H ඊඩිපස් රජ

D ආරියවංශ රණවීර I ආම්ස් ඇන්ඩ් ද මැන්

E ජෙරොම් ද සිල්වා J හරිම බඩු හයක්

K වර්ක්ෂොප් ප්ලේයර්ස්

30. ඉංග්‍රීසි නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය උදෙසා කටයුතු කළ නාට්‍යකරුවන් දෙදෙනෙකි. ( )

31. ආරියවංශ රණවීර විසින් පරිවර්තනය කරන ලද නාට්‍ය දෙකකි. ( )

32. විශ්වවිද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය දෙකකි. ( )

33. අනුවර්තන නාට්‍ය දෙකකි. ( )

34. ජෙරොම් ද සිල්වා විසින් පිහිටුවා ගන්නා ලද නාට්‍ය සංවිධානයක් වන්නේ ( )

35. 60 - 70 දශකවල නිෂ්පාදනය වූ නාට්‍ය දෙකකි ( )

* **නිවැරදි පිළිතුර තෝරන්න.**

36. ක්‍රිස්තු වර්ෂ 1856 දි පමණ සිට කියොතො නගරයෙහි රඟ දැක්වූණ '' නෙම්බුත්සු'' නම් ආශ්‍රම නර්තන විශේෂය.

   1. ''ඔකිනිගේ'' රැඟුමෙන් ඇරඹි කාන්තා රැඟුම් විශේෂයක් ලෙස සැලකේ.
   2. නෝ නාට්‍ය කලාවේ ප්‍රභවයට හේතු වූ බව කියැවේ.
   3. ජපන් සංස්කෘතියෙහි මුල්බැසගත් ආගමික හා සමාජ ජීවිතය හා බැඳුණු නර්තන විශේෂයක් ලෙස සැලකේ .
   4. කබුකි නාට්‍යයේ ප්‍රභවයට හේතු වූ බව කියැවේ.
   5. ජපානය තුළ තහනමට ලක්වූ නර්තන විශේෂයක් බව කියැවේ.

37. කබුකි අංග රචනා කලාව '' කුමදොරි'' නමින් හැඳින්වේ. එසේ වූ අංග රචනා විලාස.

   1. 100ක් පමණ වේ 2. 115 ක් පමණ වේ 3. 150 ක් පමණ වේ
   4. 120 ක් පමණ වේ 5. 112 ක් පමණ වේ

38. කබුකි වේදිකාව පිළිබඳ වැරදි ප්‍රකාශයක් වන්නේ ,

   1. හණම්චි, සිරිදෙෂි, සෙරිඅගෙ, මවරිබුතය යන අංගවලින් සමන්විත වේ.
   2. ''කකි වරි'' යනු විචිත්‍රපට ප්‍රදර්ශනය සඳහා යොදාගන්නා පසුතල වේ.
   3. වේදිකා උපකරණ අතර විශාල හා කුඩා උපකරණ '' බදෝගු'' හා '' කොදෝගු'' ලෙස හඳුන්වයි.
   4. ප්‍රධාන වේදිකාවේ සිට ෂිරසු ඇතිරූ භූමියට පැමිණීමට '' ෂිරසු බසිගෝ'' නමින් පඩි පෙළකි.
   5. චරිතයන්ට හා වේදිකා සැරසිලි වලට ක්ෂණික වේදිකාවට පිවිසි අතුරුදනලහන් වීමට '' සේරි දෙෂි'' හා ''සේරි අගෙ '' තාක්ෂණික උපක්‍රම භවිතා කරයි.

39. නාට්‍යයක ප්‍රධාන සහ අප්‍රධාන චරිත වශයෙන් පහත වර්ගීකරණයේ ජපාන නාට්‍යට අදාළ වන වර්ණය තෝරන්න.

   1. කොතක සහ ඔන්නගතා 2. ෂිතෙත්සුරා සහ වකිත්සුරෙ
   3. පෙරෂීතේ සහ පසුෂිතේ 4. තොමෝ සහ කොතකා 5. ෂිතේ සහ වකි

40. කබුකි නාට්‍යක ස්ත්‍රී චරිත සඳහා අදාළ නොවන පදය තෝරන්න

   1. තයු 2. අකුබ 3. වක ඔන්නගත
   4. මුසුමෙගත 5. ඔතොගොත

II කොටස

* **පහත A සහ B කොටස්වලින් ප්‍රශ්න 2 බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

A කොටස

1. 1. සංස්කෘත නාට්‍යයේ කතා වස්තුවේ ප්‍රධාන අංග 2 නම් කරන්න.
   2. සංස්කෘත නාට්‍යයේ කියා විකාශනය අවස්ථා පංචකය නම් කර කෙටි විස්තරයක් කරන්න.
   3. අභිඥාන ශාකුන්තලය ආශ්‍රයෙන් එම අවස්ථා පංචකය පිළිබඳ විවරණයක් කරන්න.
2. 1. නාට්‍ය ශාස්ත්‍රයට අනුව අභිනය යන්න හඳුන්වන්න.
   2. චතුර්විධ අභිනය නම් කොට ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   3. අභිනය නළු කාර්යය ආශ්‍රයෙන් යොදා ගත හැකි ආකාරය පිළිබඳ නිදසුන් දක්වමින් සාකච්ඡාවට භාජනය කරන්න.
3. 1. සොකරි නාටයයේ එන අනුරූපන අවස්ථා 4 නම් කරන්න.
   2. සොකරි කතා ප්‍රවෘත්තිය නාට්‍යය අනුසාරයෙන් විකාශනය වීමේදී ඔබ සඳහන් කළ අනුරූපන අවස්ථා කතාව හා සම්බන්ධ නාට්‍යමය ගුණය මතු කරන අයුරු පැහැදිලි කරන්න.
   3. සොකරි නාටකයේ ශාන්තිකර්ම ලක්ෂණ පිළිබඳව විමසීමක් කරන්න.

**B** කොටස

4. 1. නෝ නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ මත අතරින් දෙකක් දක්වන්න.
   2. චරිත පදනම් කරගෙන නෝ නාට්‍යය වර්ග කොට ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
   3. නෝ නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ විමර්ශනයක් කරන්න.
5. 1. කුවේණි වේදිකා නාට්‍යයට මූලාශ්‍රය වූ පුරාවෘත්ත අන්තර්ගත ඓතිහාසික කෘති දෙකක් නම් කරන්න.
   2. සමකාලීන නාට්‍යය අතර කුවේණි නාට්‍යය සුවිශේෂී වීමට හේතු පැහැදිලි කරන්න.
   3. කුවේණි නාට්‍යයෙන් මතුවන ජීවන දෘෂ්ටිය පැහැදිලි කරන්න.
6. 1. අභිඥාන ශාකුන්තලය මූලාශ්‍ර වූ ආඛ්‍යානය කෙටියෙන් දක්වන්න.
   2. එයට කාලිදාස කර ඇති වෙනස්කම් පිළිබඳ සමාලෝචනයක් කරන්න.
   3. අභිඥාන ශාකුන්තලා මුහුණදෙන ඛේදජනක අවස්ථා පිළිබඳ විග්‍රහයක් කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

නාට්‍ය හා රංගකලාව - II | 57 S II

කාලය: පැය තුනයි | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ....................................................

1 කොටස

* 1 කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයා 2 කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න. 2 කොටස A හා B කොටස් වලින් ප්‍රශ්න 2 බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

* පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

1. ප්‍රාසාංගික කලාවට නොමැති සිනමාව සතු ශක්‍යතාව වන්නේ
   1. ගැටුම් අවස්ථා නිරූපණය කළ හැකි වීම
   2. රූපණය ඉතා ප්‍රබල ලෙස උපයෝගී කරගත හැකි වීම
   3. උචිත පිටපතක් උපයෝගී කරගත හැකිවීම.
   4. එකම කාල වේලාවක දර්ශනවාර ඕනෑම සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි වීමය.
   5. විවිධ ආනුෂාංගික කලාවන් උපයෝගී කරගත හැකි වීම. (...............)

2. යථාර්ථවාදී යන්නට නොගැලපෙන වාක්‍ය තෝරන්න .
   1. මෙම රීතිය ප්‍රථමයෙන් බිහිවූයේ ප්‍රබන්ධ සාහිත්‍යය ඇසුරෙනි.
   2. යථාර්ථවාදය යනු දෘශ්‍යමාන යථාර්ථය පිළිබඳ පිළිබිඹුවක් නොවේ.
   3. විචිත්‍රා භූත රොමැන්ටික් හා අති නාටක වලට එරෙහි ප්‍රවණතාවක් ලෙස යථාර්ථවාදී රීතිය බිහිවිය.
   4. ඇන්ටන් චෙකොෆ් හෙන්රික් ඉබ්සෙන් ඇලෙන්සැන්ඩර් ඩූමා වැනි රචකයන් මෙම රීතිය වර්ධනය කළෝය.
   5. සාමාන්‍ය ජීවිතයේ ව්‍යවහාරික භාෂාවක් භාවිතා කරන කාව්‍යාත්මක ලක්ෂණ ද පවතී (...............)

3. ඔපෙරා යනු,
   1. නාට්‍ය යනුවෙන් හඳුන්වන ප්‍රාසාංගික කලා විශේෂයකි.
   2. රංගනය අභිභවා ගායනයට මුල්තැන දෙන නිර්මාණයකි.
   3. පෙරදිග බිහි වූ කලා අංගයකි.
   4. නිශ්චිත කතා වස්තුවක් නොමැති නාට්‍ය විශේෂයකි.
   5. ගායනය අභිබවා රංගනයට මුල්තැන දෙන අංගයකි. (...............)

4. පහත සඳහන් ප්‍රකාශ අතරින් රසවින්දනය සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1. නාට්‍ය හොඳින් කියවීම හෝ නැරඹීම අවශ්‍යය.
2. වාසනා ගුණය  තිබිය යුතු ය.
3. පොදුවේ නාට්‍ය කලාව  පිළිබඳ පෘථුල අවබෝධයක් තිබිය යුතුය.
4. කලා කෘති පරිශීලනයෙන් අත් කරගත් තියුණු මනසක් තිබීම ප්‍රයෝජනවත්ය.
5. රසවින්දන කෘතිය නරඹන හෝ කියවන අවස්ථාවෙන් පසුව වුවද ලැබිය හැකිය. (...............)

* **නිවැරදි පිළිතුර තෝරන්න.**

5. ' අවස්ථානුකෘතීර් නාට්‍යයම්' යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ.

1. ධනංජය 2. විශ්වනාථ 3. භරතමුනි
4. ඇරිස්ටෝටල් 5. පැරඩයිස් නිකෝල්

6. නාට්‍යය යනු ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත්වල කැඩපතකි. මෙය ප්‍රකාශ කළේ.

1. බර්නාඩ් ෂෝ 2. බර්ටෝල් බ්‍රෙෂ්ට් 3. ආරිස්ටෝටල්
4. භරතමුනි 5. විලියම් ශේක්ස්පියර්

7. නාට්‍යය යනු විනෝදය සැපයීම පමණක් නොව ප්‍රේක්ෂකයා බුද්ධියට ගොදුරු කර ගැනිම ප්‍රකාශ කළේ.

1. බර්ටෝල් බ්‍රෙෂ්ට් 2. ඇරිස්ටෝටල් 3. ශේකිෂ්පිර්
4. සිටැන්ස්ලව්ස්කි 5. බර්නාඩ් ෂෝ

8. ''මුලින්ම මට ඔබේ අත දෙන්න. මා ඔබෙන් සමුගන්නවා ස්වාමීනි.'' ජූලියස් සිසර් නාට්‍යයේ ඉහත ප්‍රකාශය කා විසින් කියන ලද්දක් ද?

1. බෲටස් 2. ඔක්ටේවියස් 3. ඇන්ටනී
4. ස්ටාටිඕ 5. මෙසාලා

9. ජුලියස් සීසර් නාට්‍යයේ කුමන්ත්‍රනකරුවන් ලෙස හඳුන්වන අයවලුන් අතර නොමැත්තේ

1. කැසියස් 2. ඩෙස් ඉයර්ස් 3. බෲටස් 4. කස්කා 5. මෙටලස්

10. '' නෑ මහත්තයා ඒ අයගේ තෝප්පි කන ගාවට තරම් දිගයි..ඔවුන්ගේ හැඩහුරුකම් දන්නෙත් නැති එකේ මට අඳුන ගන්න වෙන ක්‍රමයක් නෑ''

ජූලියස් සිසර් නාට්‍යයේ පුසියස් විසින ඉහත ප්‍රකාශය කරන ලද්දේ.

1. ජුලියස්ගේ අවමංගල අවස්ථාවේදිය
2. අවමංගල දේශනාව පවත්වන අවස්ථාවේදිය
3. කුමන්ත්‍රණකරුවන් පැමිණෙන අවස්ථාවේදීය.
4. සංග්‍රාම භූමියේදීය.
5. ඇන්ටනිගේ නිවසේදීය.

11. ජුලියස් සීසර් නාට්‍යයේ නායකයා කවරෙක්ද?

1. ජුලියස් සීසර් 2. මාර්ක් ඇන්ටනී 3. ඔගස්ට්සීසර්
4. බෑටස් 5. කැසියස්

12. ඊඩිපස් රජ නාට්‍යයේ සඳහන් වන පිය පුතු දෙදෙනා වන්නේ

1. ලායුස් ඊඩිපස් 2. ඊඩිපස් - හිමින් 3. ලා යුස් - ක්‍රයොන්
4. ක්‍රයොන් - හීමන් 5. ලායුස් -  ටෙසියාස්

13. ඊඩිපස් රජ නාට්‍යයේ පූර්ව රංගය සහභාගී වන චරිත ඇතුළත් වර්ණය වන්නේ.

1. ඊඩිපස් පූජක - ක්‍රයෝන්
2. ඊඩිපස් යොකෙස්ට්‍රා ක්‍රයොන්
3. ඊඩිපස් යෙකෙස්ට්‍රා පූජක
4. යෙකෙස්ට්‍රා ක්‍රයොන් පූජක
5. යොකෙස්ට්‍රා පූජක ගොලපල්ලා

14. ''රජ මළ අයුරු පිළිබඳ ඔබ කියූ විස්තරය ඔහු කියන විස්තර හා සැසඳුනහොත් මා නිර්දෝෂී වෙනු ඇත. ඊඩිපස් රජ නාට්‍යයේ ඉහත ප්‍රකාශය කා විසින කාහට කියන ලද්දක්ද?

1. ඊඩිපස් රජු විසින් යොකෙස්ටා බිසවට
2. ඊඩිපස් රජු විසින් ගොපල්ලාට
3. ඊඩිපස් රජු විසින් ක්‍රයෝන්
4. ඊඩිපස් රජු විසින් පණිවිඩ කරුට
5. ඊඩිපස් රජු විසින් සේවකයාට

15. රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රබලතම සංකේතය කුමක්ද?

1. තරන්තලා නර්තනය
2. නත්තල් ගස
3. තරන් තලා ඇදුම
4. මැක්රූන්
5. කුරුසිය ලකුණ කළ කාඩ්පත

16. රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රධාන නාට්‍යය උපකරණ ඇතුළත වරණය තෝරන්න.

1. කළු කාඩ්පත් ,සෙල්ලම් ඇඳුම ,උදුන, පියානෝ
2. පුටුව, නත්තල් ගස, උදුන, පියානෝව
3. ලිපිය, පියානෝව, ලියුම් පෙට්ටිය, නත්තල් ගස
4.
5.

17. '' අමුත්තකගේ කාමරේ රැයක් ගත කරන්නට මට පුළුවන් කමක් නැහැ...''

රූකඩ ගෙදර නාට්‍යයේ එන ඉහත සංවාදය කා විසින් කියන ලද්දක් ද?

1. ටෝවල්ඩ් 2. නෝරා 3. ලින්ඩේ මිය 4. සේවිකාව 5. දොස්තර රන්ක්

*** පහත දැක්වෙන පාරිභාෂිත පද ඇසුරෙන් 18 සිට 22 දක්වා ප්‍රශ්නවලිට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | භාවමය ස්මෘතිය | F | කරුණාව හා බිය |
| B | කුසුම | G | හත |
| C | තදාත්ම්‍ය විසටනය | H | භාව විශෝදනය |
| D | තත්විධික්‍රම | I | භාව |
| E | රසවාදය | J | ආඛ්‍යානය |

18. ග්‍රීක නාට්‍යය හා සම්බන්ධ වන්නේ

1. A සහ C ය.
2. A සහ D ය.
3. C සහ D ය.
4. E සහ G ය.
5. F සහ H ය.

19. .............

1. A සහ I ය.
2. C සහ D ය.
3. E සහ I ය.
4. E සහ J ය.
5. G සහ H ය.

20. නූතන යුරෝපීය නාට්‍යය හා සම්බන්ධ වන්නේ

1. A සහ B ය.
2. A සහ D ය.
3. C සහ D ය.
4. E සහ H ය.
5. G සහ I ය.

21. එපික් නාට්‍යය හා සම්බන්ධ වන්නේ ,

1. A සහ G ය. 2. C සහ J ය. 3. E සහ F ය.


4. E සහ I ය. 5. H සහ I ය.

22. ජපන් නාට්‍ය හා සම්බන්ධ වන්නේ ,

1. A සහ F ය. 2. B සහ G ය. 3. C සහ J ය.

4. E සහ F ය. 5. H සහ I ය

*** පහතින් සපයා ඇති ඡායාරූප වල දැක්වෙන පුද්ගලයන් හඳුනාගෙන 23 සිට 27 දක්වා ප්‍රශ්නවලට**






23. රූපණය සම්බන්ධ පර්යේෂණ සිදුකරමින් ' තත්විධි ' ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ ( )

24. බටහිර නාට්‍යය කලාවේ න්‍යායාචාර්යවරයා ලෙස සැලකෙන්නේ ( )

25. භාවතිශයෙන් පිරුණු වේදිකාව යථාර්ථවාදය හඳුන්වාදුන් නාට්‍යකරුවා වන්නේ ( )

26. පශ්චාත් දෘෂ්ටි කථන ක්‍රමය මුලින්ම හඳුන්වාදෙන ලද්දේ ( )

27. යථාර්ථවාදී නාට්‍ය කලාවේ පියා ලෙස සැලකෙන්නේ ( )

*** පහත සඳහන් ප්‍රශ්න අංක 28 සිට 32 දක්වා නොගැලපෙන පිළිතුර තෝරන්න.**

28. 1. යොමු පහන 2. ස්ට්‍රිප් ලාම්පු 3. ධාරා පහන්

4. හැලජන් පහන 5. වර්ණ චක්‍රය

29. 1. වේෂභූෂණ 2. සමාරෝපය 3. අංගරචනය

4. රංගලංකරණය 5. රංගාලෝකය

30. 1. බූතයි 2. ශෂිගකර් 3. ජිඋතයිෂි

4. කගමිනොම 5. මචරිබූතයි.

31. 1. එක්කුක්ලිමා 2. ඔර්බිෂ්ට්‍රා 3. තෙය ටෝන්

4. පැරඩෝස් 5. ස්කිනි

32. 1. මත්තවාරති 2. රංග ශීර්ෂය 3. එපිඩෝරස්

4. නේපත ගෘහය 5. රංග පීඨ

*** පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

33. නළුවාගේ ආවේශය පිටුදකිමින් නළුවා චරිතය ගෙනහැර දක්වන්නකු ලෙස විය යුතුය. මෙය ප්‍රකාශ කරන ලද්දේ

1. එමිල්සෝලා 2. ඇරිස්ටෝටල් 3. මියර්හෝල්ඩ්

4 බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් 5. ස්ටැනිස්ලව්ස්කි

34. ''කාන්තාවගේ විමුක්තිය සොයා ගත යුතු වන්නේ ඇයගේම අධ්‍යාත්මය තුළින් බව ප්‍රකට කරනා චරිතය වන්නේ ,

1. සකුන්තලා නාට්‍යයේ සකුන්තලා
2. කුවේණි නාට්‍යයේ කුවේණි
3. රූකඩ ගෙදර නාට්‍යයේ නුවුරා
4. ජූලියස් සීසර් නාට්‍යයේ පෝෂියා
5. ඊඩිපස් නාට්‍යයේ යොකෙස්ට්‍රා

35. ඝාතකයා තමාද යන සැකය මූල බීජය ඊඩිපස් ගේ සිතෙහි පහළ වූයේ ,

1. තුන්වන අංකයේ දී ය.
2. හතරවන අංකයේදී ය.
3. පළමුවන අංකයේ දීය
4. පූර්ව රංගනයේ දී ය.
5. දෙවන අංකයේ දී ය.

36. පහත දැක්වෙන නාට්‍යය අතරින් ග්‍රීක ප්‍රහසන නාට්‍යයක් වන්නේ

1. අල්කස්ටිස්ය
2. කුක්ලොප්ස්
3. ඉක් නෙව් ටා ඉය.
4. වලාකුළු
5. ප්‍රොමිතියස් බන්ධනය

37. කාව්‍යශාස්ත්‍රය හ නාට්‍යශාස්ත්‍රය. සිංහලයට පරිවර්තනය කළ විද්වතුන් දෙදෙනා පිළිවෙලින් දැක්වෙන්නේ

1. සිරිසේන විමලවීර හා වෝල්ටර් මාරසිංහ
2. බන්දුල ජයවර්ධන හා ඒ.වී සුරවීර
3. සිරිසේන විමලවීර හා ජෝන් ද සිල්වා
4. ඒ.වී සුරවීර හා එදිරිවීර සරත්චන්ද්‍ර
5. ඒ.වී සුරවීර හා වෝල්ටර් මාරසිංහ

38. කාව්‍යශාස්ත්‍රයේ සඳහන් නොවන්නකි.

1. අනුකරණය
2. ස්ථානීය ඒකත්වය
3. කාල ඒකත්වය
4. භාව ඒකත්වය
5. ක්‍රියා ඒකත්වය

39. ජනරජය නම් කෘතිය රචනා කරන ලද්දේ

1. ඇරිස්ටෝටල්
2. සොක්‍රටීස්
3. ප්ලේටෝ
4. පේශී, ස්ටෝ ටොස්
5. ඊස්කිලස්

40. රසිකයෙක් යනු

1. ඕනෑම ප්‍රේක්ෂකයෙක් හඳුන්වන නාමයකි.
2.සහෘදයා යන්නට සමාන අර්ථයක් ගෙන දේ
3. උසස් නිර්මාණ කිරීමට සමත් කලාකරුවා ය.
4.නාට්‍යයක් රසවත්ව ඉදිරිපත් කරන්නාය.
5. ප්‍රතිභා ව්‍යුත්පත්ති ශක්තින්ගෙන් ගෙන් යුක්ත වූවකි.

II කොටස

* **පහත සඳහන් A හා B කොටස් වලින් A කොටසින් ප්‍රශ්න දෙකකටද B කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.**

**A කොටස**

1. 1. කාව්‍ය ශාස්ත්‍රය නම් කෘතිය රචනා කළ ග්‍රීක දාර්ශනිකයා කවුද ?
   2. කාව්‍ය ශාස්ත්‍රයේ එන නාට්‍ය වර්ග නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.
   3. කාව්‍ය ශාස්ත්‍රය නම් විචාර කෘතිය පිළිබඳ හා එහි කතුවරයා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

2. 1. නාට්‍යයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වයට සෘජුව වගකියන පුද්ගලයා කවරෙක්ද ?
   2. ඔහු විසින් නාට්‍ය පිටපතක් තෝරාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දක්වා නාට්‍ය පිටපතක හා නිෂ්පාදන පිටපතක අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
   3. නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ දී ඊට දායක වන ප්‍රධාන පුද්ගලයාගේ කාර්යභාරය නම් කොට ඒ පිළිබඳ විස්තර කරන්න.

3. 1. එලිසබතින යුගයෙන් පසු යුරෝපයේ බිහි වූ විවිධ නාට්‍ය සම්ප්‍රදායන් අතරින් හතරක් නම් කරන්න.
   2 ඒ අතරින් එක් නාට්‍යයක සාම්ප්‍රදායික සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.
   3. එම සම්ප්‍රදායට අයත් වන එක් නාට්‍යයක එකී ලක්ෂණ නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

**B කොටස**

4. 1. ජුලියස් සීසර් නාට්‍යට පාදක වූ අනුභූතිය කුමක්ද ?
   2. සීසර් ඝාතනය කිරීමට පෙළඹෙන්නේ කුමන හේතුවක් නිසාද ?
   3. ජුලියස් සීසර් නාට්‍යනේ අපට ලද හැකි ජීවිතාවබෝධය පිළිබඳ විමසීමක් කරන්න.

5. 1. ඊඩිපස් නාට්‍යයේ තේමාව කුමක්ද ?
   2. ඊඩිපස් නාට්‍යයේ දුබලතා හා ප්‍රබලතා පිළිබඳ විමසිමක් කරන්න.
   3. ඊඩිපස් නාට්‍ය පශ්චාත් දෘෂ්ටි කතන රීතය කර සිද්ධි පෙලගස්වා ඇති ආකාරය පැහැදිලි කරන්න.

6. 1. රුකඩ ගෙදර නාට්‍යයෙන් සමාජයට ලැබෙන පණිවුඩය කුමක්ද ?
   2. රුකඩ ගෙදර නාට්‍ය යේ ඇති යාර්ථවාදී පක්ෂණ හතරක් දක්වන්න.
   3. ස්වාමී භක්තිය හා දරු සෙනෙහස පිළිබඳ සංකල්පය . රුකඩ ගෙදර නට්‍යයේ නුවුරාගෙන් මනාව පිළිබිඹු වේ. මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.